9237

9237

# බරනම ගබසක

හෙවත් සන්න සහිත

# බාරශ කාව්‍යය.

———):✱:(———

අත්තරගම රාජගුරු පඬිතුමන්ගේ

ශිෂ්‍යවූ

කරතොට ධර්මාරාම

නායක ස්වාමීන් වහන්සේ විසින්

රචනාකොට

රාජාධිරාජසිංහ මහ[illegible]තුමන්

වෙත පිළිගන්වා[illegible]

ඇම්. ඩී. ඩී. කරු[illegible]

විසින්

කෑගල්ලේ

“විද්‍යාකලා” යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරන ලදී.

———

1923.

# සාඥපනය.

බරනම ගබසඝ යන මෙම ප්‍රබන්ධයේ කර්තෘභූත කරතොට ධර්මාරාම ස්වාමීන් ගැන වැඩිදුර විස්තර නොකළාට සියලුදෙනා අතරම ප්‍රසිද්ධයි. රාජාධිරාජසිංහ රජතුමාගේ පණ්ඩිත භාවයද එසේම කවුරුත් දනිති. එම නරපතිතුමාට ඔප්පුකර ගම්වරයක් ලැබීමට තරම්වූ මෙම ප්‍රබන්ධය කොතරම් උසස්ද යනු පහසුවෙන් සාටවුවත් අවබෝධවන බැවින් ඒ සඳහා නොවෙහෙසෙමු.

මුන්වහන්සේ කෙරෙහි රජතුමා කෙතරම් පැහැදුණේද යනු මහ සංඝයා ඇතුළු රාජපිරිස මධ්‍යයේ ප්‍රකාශකර තිබෙන මතු දක්වන කවිය ගැන සිතනකල පෙනියයි එනම්:—

ක ර තොට   දම්රම් නායක යතිඳු ස   ට
න ර දෙ ට   මෙමා බුහුමන් කරපු හැටිය ට
ව රි ගෙ ට   ගෝලතමකාටඔබගෙ යමෙකුට
ව ර ද ට   යමක් නොකරවී මින් ඉදිරියට

තවද මුන්වහන්සේ විසින් කව් සිළුමිණ
ඉල්ලා යැව් කවියක් මෙසේයි.

ර ක ලා,   ඝොවුළු, ලීසිට, තැළුවා, සෙමි   න
පැණ ලා,   ගිය මෙගණ සයමැද වණ කොමේ   න
ද න ලා   මෙනම යුත්පොත විමසා සොදි   න
නු මූ ලා   සිවළුවනු අපවෙන මෙහි මෙදි   න

මුන්වහන්සේගේ අපවත්වීම ගැන එවකට
සිටි පඬිතුමෙකු විසින් කළ ප්‍රබන්ධයක්.

දි නි ඳු   සාසන භුවන් මුදුනහ සියහ මැසිතුරු සලවැ   දේ
සි නි ඳු   සද්දම් අමා නිරණින් සුදන කුමුදිළු කරන   දේ
ප සි ඳු   දම්රම් මෙයති හරිඳු උදුවී බබලන ස   දේ
මි රි ඳු   මිරුපල ගැවින් අල්ලානගිය හමිනින් තිවර   දේ

(ශෙලෂ:)

මෙම පොත මීට ප්‍රථම මුද්‍රණය කර තිබුණු නමුත් දැනට සොයා ගැනීම දුස්කරව තිබෙන බැවින්ද පුරාණ පොත් වලින් හැකි පමණක් සොයා මහජනයා ඉදිරියේ තැබීම අපට ඉතා සතුටක් බැවින්ද මෙසේ මුද්‍රණය කළෙමු. එසේ වුවත් විකිණීමේ බලාපොරොත්තුවෙන්ම වඩා ප්‍රයෝජනයක් නැති අව්‍යක්තයන් විසින් ප්‍රබන්ධ කාව්‍ය පොත් දස දහස් ගණන් පහසුවෙන් විකිණී යන නමුත් මෙබඳු පොත් විකිණීම ඉතා දුස්කර බැවින් කොපි ස්වල්පයක් මුද්‍රණය කළබව සැලකිය යුතුයි.

තවද මෙහි අගට රටේ වඩා ප්‍රකට නැති පුරාණ කියමන් ස්වල්පයක් ඒවායේ කතෘ වරයන්ගේ නම් සහිතව අපේ හැකිවෙ හැටියට ඉතා පුරාණඒවායින් පටන්ගෙන ක්‍රමයෙන් යොදා ඇත.

ඒවායින් රාජාධිරාජසිංහ රජතුමාගේ කවිය සහ අඳරේ ගේ කවිය ව්‍යවහාරයේ ආ ඒවාය. කල් යාමෙන් ඒවා දන්නා අය නැතිවිය හැකි බැවින් මෙහි යෙදීමු. අනිත් සියල්ලම පොත් වලින් උපුටාගත් ඒවාය.

9237

# ඩාරශ කාව්‍යය.

1 සිසි සිසි දයල’නිනි නිනි නිරජ ලල ල ල
සිරි’වල දියත වසවමු සිතද කුස ක ල.
සිදි බව ගිම්ණ රත’නගමිණ පළුත ස ල
සිරිගත නිරත නමදිමි නවණනු වත ල

1.“ සිසි, චන්‍ද්‍රයාට බඳුවූ; සිසි, සීතලවූ; දයල, කරුණා සිත් ඇති; අණඉනි, සත්වයන් (භව බන්ධනයෙන්) මුදන්නාවූ; නි ප්‍රඥ නමැති; නි, ගංගාවන්ට; නිරජ, සමුද්‍රය වැනිවූ; ල, (සව) චිත්ත සන්තානයෙහිවූ; ල, ලාමකත්වය; ල, චිත්තයෙන්; අල, දුරුකළාවූ හෙවත් සකල කෙලශයන් නැසුවාවූ; සිරි, (අනොප ම බුද්ධ) ශ්‍රීන්; අවල, ගැවසී ගත්තාවූ; දියත, ලොක නායක වූ; වස, (කාම) වශගත්වය; වමු, උද්හිරණය කළාවූ; සිතද, (ගෙහ සිත) සෙනහයද; කුසකල, ඡේදනය කළාවූ නොහොත්; කුස කල, කුසරජ කාලයෙහි; සිනද, සිංහ සමාන ස්වර ඇත්තාවූ; සිදි, වියලවන ලද හෙවත් අහකරන ලද; බවගිමණ, සංසාර නමැති ග්‍රීෂ්ම ඇති; රනඅනගමිණ, අභිප්‍රාප්ති දයක අනර්ඝ මාණි ක්‍ය රත්නයක් බඳුවූ; පළු, නිපුණවූ; නොහොත්, පළු, ප්‍රකාශි තවූ; නසල, අකම්පාමානවූ; නවණනු, නගරවණිනා සත්‍රිවණි නා(දිය) නොකරන්නාවූ; වතල, විඛ්‍යාතවූ; හෙවත් ලොකප්‍රසිද්ධ වූ; සිරිගන, සර්වඥ රජෝත්තමයාණන් වහන්සේට; නිරත, අන වරතයෙන්, නමදිමි, (භක්ති ප්‍රෙමාදී නාරුවනතොත්තමාංගය කාරණකොටගෙන සාදරයෙන්) නමස්කාර කෙරෙමි.

2 න වරද නවස සිරි පනල මණී මනර ක
නරමණ නතණ වසුලව නම්සු පස ස ක
නක සඳ දමන නල’සනි රිසිරු නද පි ක
නවනු සනද පුරණ රසු නමදු විත ය ක

2. නවරද, නිරවද්‍යවූ; සිරි, (සකල රාජ්‍ය) සම්පත්තියෙහි; නවස, වශගනොවූ නොහොත්; වරදන, (සතරමහා නිධානගත මුක්තාමාණික්‍යාදි) උත්ම්ධනයෙහි; වසන, වසගනුවූ; මණි, සිතු

මිණි රුවනක් මෙන්; පතළ, ප්‍රසිද්ධවූ; මනරක, මනොසංරක්ෂණය කරන්නාවූ; නරමණ, (කිසිවෙක්හි) නොඇලෙන්නාවූ; නතණ, තෘෂ්ණා රහිතවූ; අව, (සතර) අපාය; සුලව, මනාකොට සිඳුණාවූ; ගමිසු, මාත්සර්ය රහිතවූ; පසසන, (දිව්‍ය චක්ෂුරාදි) පස්ව චක්ෂූන් ඇත්තාවූ; නනසඳ, චන්ද්‍රයාට බඳුවූ මුඛ ශ්‍රී ඇති; දමන, (පුරුෂ) දමනවූ; නලඅසනි, නාගෙන්ද්‍රයන්ට සෙවත්තාත්පයසීංයෙන් සියලුසත්වයන්ට; රිසිරු, (අනෙකාභාවගවූ) රූපශ්‍රීඇති; නදපික, කුරවීක නාද ප්‍රතිභාග (මධුර) ස්වර ඇති; නව අනුස, ක්ලෙශානුසය රහිතවූ; නදපු, දපී රහිතවූ හෙවත් ශාන්තවූ; රණරසු, (ශ්‍රීශරීරයෙන් නිගීත) ස්වර්ණ රශ්මි කදම්බයක් ඇති; විනයක, විනායකවූ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේට; නමදු, (සාදරයෙන්) නමස්කාර කරවා.

3 ගත යදි සතොස දගතුත දවනි දමන ද
ගරු පිසු වදු වනර සත නව ගනත'ම ද
ගණ නද නකළ නපියසි හරත නප'ප ද
ගග ගග නාරති සස සස නජර දද ද ද

3. ගත යදි සතොස, ගන්නාලද යාචක සන්තුෂ්ටතා ඇති නොහොත් ගත් අයදි ප්‍රතිග්‍රහණය කරණලද (බ්‍රහ්මාදීන්ගේ) ආරාධනා ඇති; සතොස, (චතුර්විධ සන්තොෂයෙන්) සන්තුෂ්ටවූ; දගනුත, ජගත් ප්‍රසිද්ධවූ; නොහොත් සංස්තුතවූ; දවනි, ජවන ප්‍රඥා ඇති; දමනඅද, (ක්ලෙශොපශමයෙන්) දමිතවූ චිත්ත සන්තානඇති නොහොත් දමිඅනද, සර්වඥදයකවූ; ගරුපිසු, ගර්පුස්ද්ජනයකළාවූ නොහොත් ගරුපිසු, මාතෘ පිතෘ ගුරුවරාදීන් පුදන සුළුවූ; නර, මනුෂ්‍යයන්ට; සත, ස්නෙහඇත්තාවූ; නොහොත්; නරසත, සත්වයන් (තිවන් සැපතින්) සතසන්නාවූ; නොහොත්; නරසත, අරසස්වරූප නොවන්නාවූ; නවග, වර්ග නොවන්නාවූ; හෙවත් සාමාග්‍රි භාවය කැමති වන්නාවූ; නොහොත්; නඅවග, අපාගත නොවන්නාවූ; අමද, නිර්වාණාමෘත දායකවූ; ගණ නදන කළ, ගණයා සංතොෂකළාවූ; නපියසි, ග්‍රාමයන්; හෙවත් කෙත් වත් නැත්තාවූ; නොහොත්; ගණනදන, (ආර්යගණ සඞ්ඝයාම) පුත්‍රකොට ඇති; කළණ, කල්‍යාණ ධර්මයෙහි පියගුසි, ප්‍රියෙච්ඡා ඇති; අනපඅපද, අනල්පවූ විපත්තීන්; හරන, දුරුකරන්නාවූ; අහිඅය, (සකල) සත්වයන්ට අගුවූ; අගග, (සංසාර) කොටි ප්‍රාප්තවූ; හෙවත් නිර්වාණ පුරයට පැමිණියාවූ; නරති, ආලය රහිතවූ;

සසසස, ප්‍රශස්තයන්විසින් ප්‍රශස්තාවූ; නජර, ජරාරහිතවූ; දදදද, දායකාතිදායකවූ; නත, සර්‍වඥයන් වහන්සේට; වඳුව, නමස්කාර කරවු.

4 ලල ලල විදසි කක'කක න'ගන දද ද ද
ලක සත දුරම රසපිය බිදම'නම ප ද
ලස නවසඳසෙ න සදන සවන'මන ප ද
ලකුළුණු නිදි සමපන වි සකණ දන න ද

4. ලල, (තමන් වහන්සේගේ) චින්තනයෙන් අන්‍යයන්ගේ චින්තනය; අලල, ආලෝලනය කරමින්; විදසි, විශේෂයෙන් දක්නාවූ; දද, අඥානයන්ට; දද, ධජකොට ඇති; කක, කුත්සිතවූ මේ ශරීරය; අකක, අකක්කොටද; හෙවත් මදට දෙකහමාරක් කොටද; නඅගන, අගය නොකරන්නාවූ; හෙවත් කදලිස් කන්ධොපමාදීන් නිස්සාරකොට දක්වන්නාවූ; ලකසත, ලක්ෂණ ශාස්ත්‍රයෙහිදු හෝ නොහොත්; ලඝසත, පාපවිණි හිත සත්වයන් කෙරෙහි; දුරම, ඇළුම් නැත්තාවූ; අබිදම්, අභිධර්‍මය සම්බන්ධවූ; රස, අමෘතරසයදු හෝ නොහොත් ධර්‍මරසය; පිය, ප්‍රියවූ; දෙහෝ නොහොත් පානයකරන්නාවූ; නවසඳසෙ, අභිනව පූර්ණ චන්ද්‍රයා මෙන්; ලස, බබලන්නාවූ; නසදන, අනගායමිවූ; නොහොත්; නසදන, පාපප්‍රතිච්ඡාදක නොවූ; නොහොත්; නසදන; (ලෝකයෙහි) පහවූ; ඡදනයන් ඇති; අමනපද, නිර්‍වාණාමෘත ප්‍රදානය කරන්නාවූ; කුළුණුනිදි, කාරුණාවට නිධානවූ; ල, සිත් ඇති; සම්පන, මනාවූ අර්පණ සමාධියෙහි; විසකණ, විචක්ෂණවූ; දනනද, (ක්ලේශයන්) ජයගන්නා ලද සිත්ඇති; නොහොත්, දනනද, සන්තොෂ කරවූ; සවන සර්‍වඥයන් වහන්සේගේ; පද, ශ්‍රී චරණ යුග්මය; නම, (සාදරයෙන්) නමස්කාර කරවු.

5 නිමු ගමි දමන නව'නිසු දරිසි නණ සි ස
නිව න දියදද පලසර දන නිනු ස ය ස
නිසග ම'රඝ සිරි'සුල නවදු වගර'ශ්‍රී ස
නිවරණ නිමද සිව නර නව සදන න ස

5. නිමුගමි, නිමාකරන ලද (සංසාර) ගමන් ඇති; දමන, (දමිය පුත්තන්) දමනය කරන්නාවූ; නවන ඉසු, ක්ලේශ තාප තෙවර්ෂා ඇති; නොහොත්; ඉසු, ඊර්ෂ්‍යා චින්තායන්; නවන, නාපනය කරන්නාවූ; දරිසි, (සියල්ල) දක්නාවූ; නණසිස, තෘෂ්ණාව

සිස්කළාවූ; නිවන, (ක්ලේශ පරිලාහ) නිවන්නාවූ; දියදද, අම්බුධරෝපමවූ, නොහොත්; දියදද, (තුන්) ලොවට නැගූ ධජයක් හා සමානවූ; පලසර, කම් ඵලානුසම්මරණය කරන්නාවූ; නොහොත්; පලසර, (මාර්ගඵල සංඛ්‍යාත) සාරඵල ඇති; දනතිනු, (සමස්ත) ජනයන් විසින් සංස්තුතවූ; සයස, සවකීයවූ යසස්ඇති; තිසගම්, (ක්ලේශ) සංගම විරහිතවූ; අරයසිරි, පූජාහී ශ්‍රියාව; උපුලන, උද්වහනය කරන්නාවූ; ගරු, ගෞරවස්ථානීයවූ; නොහොත්; ගරු, (සියලු ලොවට) ගුරුවූ; අපිස, අලෝපච්ඡවූ; නිවරන, පහවූ ආවරණයන් ඇත්තාවූ; හෙවත්; නිරාවරණවූ; නිමද, මදරහිතවූ; සිවන, නිර්වාණයට නායකවූ; අරණවස, ආරණ්‍යවාස ඇති; දනන, ධ්‍යානාත්නය; හෙවත්; ධ්‍යාන නමැති ආහාරය; අස, අනුභව කරන්නාවූ; නොහොත්; දනන, ජයග්‍රහණය කරන ලද; අස, ආශාසංඛ්‍යාත තෘෂ්ණා ඇති සර්වඥයන්වහන්සේට; වඳුව, (භක්ත්‍යාදරයෙන්) නමස්කාර කරවූ.

6 සිලවන ගණ නදන දසනප නිදි සු ද ග
සිව බග නපුන රමසනු වඳුව ය'පිණ ග
සිරි දිරි සරස වර න'වනද වනරු ණ ග
සිසි'සිසි න දන නන'නන දුමිඳ'ගග'ග ග

6. සිල්අවන, සීල පාලනය කරන්නාවූ; ගණනදන, සව් ගණයා සනතුෂ්ට කිරීමෙහි; අදගස, ආඩ්‍යාස ඇති; නොහොත් ගණන; ගණනායකවූ; දනදස, දානාභ්‍යාශ ඇති; තපනිදි, තපොනිධානවූ; සුදග, (නිර්දෝෂවූ) ශ්‍රී ශරීර අවයවයන්ගේ හෝ නොහොත් විශුද්ධ බෞද්ධාංගඇති; සිවබග, නිර්වාණභාගීවූ; රමසනු, ස්ත්‍රීන් කෙරෙහි ස්නෙහයක් නැති; නපුන, නැවත නොමඇත්තාවූ; අය, සැපතින් හා; පිණ, පුණ්‍යයෙන්; අග, අග්‍රවූ; සිරි, (බුද්ධ රාජ්‍ය) ශ්‍රීය; දිරි, දරන්නාවූ; සරස, රූපරශ්මි ධර්මරශ්මි සහිතවූ; වරණ, වලකනලද; වනදව, තෘෂ්ණා ධාවනය ඇති; නරුණග, (මෘදු තරුණවූශ්‍රී) ශරීරාවයව ඇති; සිස්ඉසි, ක්ෂයවනලද (පාප) ඉච්ඡාවන් ඇති; සිනද, (අභිරූ) සිංහනාදිවූ; නන්අණන, නොයෙක් ප්‍රාණීන්; අන, නිර්වාණ ප්‍රවෙසනය කරන්නාවූ; දුමිඳ, බොධිද්‍රැම මූලයෙහි වජ්‍රාසනාරූඪව වැඩහිඳ; අගග, පාපප්‍රහාණය කොට; හෙවත්, සකල ක්ලෙශයන් නසා; අගග, (ලොකා) ග්‍ර භාවයට හෙවත් සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණියාවූ ඒ බුදුරජාණන් වහන්සේට; වඳුව, (ආයුවණ්ණාදි චතුර්විධ ආනිසංස ප්‍රතිලාභය පිණිස සාදරයෙන්) ප්‍රණාමය කරවූ.

7 දද්'ද්'ද රජන සස සස නිරත ගග'ග — ග
දප්'පන නරඝ සිය පිණ ලකුණ දන න — ග
දම නන ගවන නසරණ වඳුව සුපිරු — ග
දන මද නිවද නනුගද සතොස දියන — ග

7. දද, විසුදු බ්‍රාහ්මණයන්ගේ; අද, විහානයෙහි; අදරජන, ලක්‍ෂණ ප්‍රකාශන ප්‍රශ්න ව්‍යාකරණාදි කාරණයෙන් ආදර නිපද වන්නාවූ; සස, ප්‍රශස්තවූ; සස, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් ඇති; නගග, සුනෙරු පර්වතයාමෙන්; නිර, ස්ථිරවූ; අගග, නිෂ්පාප වූ හෙවත්, පව් නැසූවාවූ; දප්අපන, (ක්ලේශාදි) දර්ප දුරුකළාවූ; නරඝ, නිරඝසවූ; හෙවත් රහසිනුදු පව් නොකරන්නාවූ; සිය පිණලකණ, ශතපුණ්‍ය ලක්‍ෂණධරවූ; දනනග, (සමස්ත) ජනයා ට අග්‍රවූ; නොහොත්; දනනග, අනංගයා ජයගත්තාවූ; දමන්, සධර්මයන්; දන, සත්වයන්ට; අනවන, අවබොධ කරවන්නාවූ; නසරණ, ප්‍රාණවධ නොකරන්නාවූ; නොහොත්, අශරණ සත්වයන්ට පිහිටවූ; සුපිරු, (ලක්‍ෂණ ව්‍යඤ්ජනයෙන්) සම්පූර්ණවූ; අන, දෙහශ්‍රී ඇති; නොහොත්, සුපිරු, මනාකොට පුරනලද; අන, (සොසානි කාංගාදි) ධූතාංග ඇති; දන, (කෘතාධිකාර) ජන යන්ට; අමද, නිර්වාණාමෘත දායකවූ; නිවද, නිර්වචන ඇති; නො හොත්; දනඅමද, බොහෝවූ ජනයාගේ; නිව්අද, නිවනලද චිත්ත සන්තාන ඇති; නනුගද, පතලාවූ ව්‍යක්ත වචන ඇති; නො හොත්; අනනුඅගද, (ශිතුෂ්ණාදි) ශරීරාබාධයක් නැත්තාවූ; දිස නග, ජගතෙන්ද්‍රයාහට; හෙවත් බුදුරජාණන්වහන්සේට; සතොස, (චිත්ත) සන්තොෂයෙන් යුක්තව; වඳුව, නමස්කාර කරවු...

8 කයන විදුමන සුරනර පුදන සනුව — න
කපිදන රුසිරි නිසලන නමද දසුන — න
කස'සප සු මන වල සුව නන නනමර — න
කරනම නිමල නපරිසි සවන දරව — න

8. කයන, ක්‍ෂයනොවන්නාවූ; විදුමන, පණ්ඩිතමන්ඇති; හෙවත් අක්‍ෂය ප්‍රතිභාන ප්‍රඥා ඇති; නොහොත්; කයන, අහසි න් යන්නාවූ; විදුමන, (ඍද්ධි විධාදි) විද්‍යාවන් දන්නාවූ; සුරනර පුදන, දිව්‍ය මනුෂ්‍යයන් විසින් පුදන ලද්දාවූ; සනුවණ, ෂට් (අ සාධාරණ) ඥාන ඇති; කපිදන, කාය පිධානය කරන්නාවූ; හෙ වත් ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනය කොට සිවුරු මලදනාවූ; රුසිරි, (වාත්‍රිංශත්වර මහා පුරුෂ ලක්‍ෂණයෙන් හෙබියාවූ රූපශ්‍රී ඇති;

නිසලන, (ලාභා ලාභාදි ලෝක ධර්මයෙහි) නිශ්චලවූ; නමද, (පුරුෂ මදාදි) මදරහිතවූ; දසනන, දසවිධ ඥාණබල ඇති; කස, කෘෂි කර්මයහා (තදුපචාරවූ ගොරක්ෂාවණික්) කර්මාදිය; අසප, අසත් ප්‍රායකොට ඇති; සුඹන සෞමනස්‍ය චිත්තයෙන් යුක්තවූ; වලසු ව, වනාන්තර (වාසය) සැපකොටඇති; නතණ, තෘෂ්ණරහිතවූ; නමරණ, (පුනර්භව විරහිත බැවින්) මරණ නැත්තාවූ; නිමල, (ක්ලේශමල විරහිත බැවින්) නිර්මලවූ; නපරිසි, කෙලෙසුන් නවනු කැමතිවූ; දරවන, තෘෂ්ණාවිදාරණය කළාවූ; සවන, සර්වඥයන්වහන්සේට; නමකර, (භක්ත්‍යාදර චිත්තයෙන්) නමස්කාර කරව....

9 ලතවනු නවන මිදිමන තරණි න'ගරි සි
ලසනලු පණමි ගනගරන මගිව බදි සි
ලක සකුදන සිමුව සවන ය දිලව රි සි
ලල ලල ජරනි නිනිනිනි ලයද සිසි සි සි

9. ලතවනු නවන, චිත්තසන්තාප නොවන්නාවූ; මිදිමන, (කෙලෙසුන් කෙරෙන්) මුක්තවූ සිත් ඇති; නොහොත්; මිදිමන, (සත්ත්වයන් සංසාරයෙන්) මුක්තකිරීමෙහි පැවති චිත්ත ප්‍රවෘත්ති ඇති; තරණි, (සංසාර ප්‍රතරණයට) නාවුකාවක් වැනිවූ; න අගරිසි, පාපයට නොරිසිවූ; නොහොත්; අනගරඉසි, අනගාරීභාවය ඊප්සිතවූ; ලසනඅල, බබලන්නාවූ ශ්‍රී ශරීරාලෝක ඇති; ගණග, ගණ ප්‍රධානවූ; අරණ, (ක්ලේශ) යුද්ධ රහිතවූ; මගි, චතුරාර්‍ය මාර්ගයන් ඇත්තාවූ; නොහොත්; රණ, (කුක්කුට වට්ටකාදි) යුද්ධයන්; අමගී, නොබලන්නාවූ; නොහොත්; අමගී, සද්ධර්මාමෘතගායනා ඇති; අවඅබදඉසි, (සතර) අපායෙහි නොබැඳීම කැමති වන්නාවූ; ලක සකුදන, අලංකාර සාස්තෘතාභ්‍යාස ඇති ජනයන්ට; සී, සිංහවූ; හෙවත් උත්තමවූ; මුව සවන, මෝහ වසඟ වන්නාවූ; යදි, යාඥවෙහි; ලවරිසි, සවල්පවූ ඉච්ඡා ඇති; හෙවත් අකැප ආරාධනා පිළිනොගන්නාවූ; නොහොත්; ලකසකු, ලක්ෂ සංඛ්‍යාතවූ; දන, ජනයාට; සිමුව, සිංහ මෘග සමානවූ; යදි, යාචකයන්ගේ; රිසි, ධනෙච්ඡාව; ලව ඡේදනය කළාවූ; ල, චිත්තයෙන්; ලෝ, ලෝකය; අලල, අලලාබලන්නාවූ; අජර, තුන්ලොවට ගුරුවූ; අණිනි, ප්‍රඥප්ති ආ ආඥාව කාරණකොට ගෙන; නි, සත්ත්වයන් මෝක්ෂයට පමුණුවන්නාවූ; නී, ප්‍රඥාවට; නිලය, වාස භවනයක් වැනිවූ; අද, සිත් ඇති; සිසි, සිහි ඇත්තවුන්ට උතුම්වූ;

ඍසි ඉසි, සෘෂීන්ට සෘෂීවූ; සවන, සර්වඥයන්වහන්සේට; පණමි, (භක්ත්‍යාදරයෙන්,) ප්‍රණාමය කෙරෙමි.

10 ගග' ගග දමිඳු නන නන නදන සිසි සි  සි
ගණරුත වදන වනරව සරසරි දිරි  සි
ගණ පියවඳුව නුසමර නපුන ගබව  සි
ගද සුදිනිපත සදන දන නගත වල  සි

10. අගග, දුක් නසන්නාවූ; අගග, අග්‍රාති අග්‍රවූ; දමිඳු ධර්මාධිපතිවූ; නෙඅණන, නොයෙක් සත්වයන්ගේ; නන, චක්‍ෂුයන් හෙවත් මුහුණු; අදන, (තමන්වහන්සේ දීශාවට) ආකර්ෂණය කරන්නාවූ; සී, (ධවල දසන රශ්මි කදම්බ පරිවෘතත ශොභණ) සිනාඇති; නොහොත්; නන, නානාවිධවූ; අණන, සත්වයන්විසින්; නදනසි, කරණලද සන්තොෂ සෙවන ඇති; සඉසිසි, ෂට්විධවූ සෘෂීන්ට සෘෂීවූ; හෙවත් උතුම්වූ; ගණරුත විදන, මෙසධ්වනි සමාන බස් ඇති; නොහොත්; ගණරුත වදන, අඹියෙන් අවිරලවු වචන ඇති; සරසවන, රස සහිත වන්නාවූ; රව, ශබ්ද ඇති; හෙවත් මධුරොදාර නාදඇති; රිදිරිසි, මනොඥවූ සෘඞිඇති; නපුන ගබවසි, නැවත ගර්භවාසයක් නැත්තාවූ; හෙවත් පුනර්භව රහිතවූ; ගද, (තමන්වහන්සේගේ මූල භාෂානුගත ගුඪමාගධික) වචනයන්; සුදි, පණ්ඩිත ජනයන්ගේ; නිපත, (ශබ්ද) නිෂ්පත්ති යට; සදන, සාධනවූ; හෙවත් කාරනවූ; දනනග, ජනාග්‍රවූ; නොහොත්; දන අනඝ, මකරධ්වජයා ජයගත්තාවූ; නවලසි, දෞෂ්ශීල්‍ය භාවය විරහිතවූ; ගණපිය, ගණයාට ප්‍රියවූ; නොහොත්; ගණපිය, ජනසංගණිකා රාමයෙන් දුරුවූ; නොහොත්; ගණපිය, සංඝපිත්‍රුවූ බුදුරජාණන්වහන්සේට; අනුසමර, (ගුණානු) ස්මරණය කොට; වඳුව, (භක්ති ප්‍රෙමයෙන් සතොස) නමස්කාර කරව.

11. සනත දසවණ' රණවසි දමති නරව  නි
සපිරග වඳුම නලපු රිසිඝරමග ස  නි
සයස නුතිත දරසල පදද යදිනව  නි
සසිත නසිරිද සුතිවත නම්ද මිගමු  නි

11. සනනද, සාණ සන්තොෂ කරන්නාවූ; නොහොත්; සනඅද, සකල ලොකවාසීන්ගේ සිත් සනසන්නාවූ; සවණ, (නීල පීතාදි) ෂට් වර්ණසත බුඬ රශ්මින් ඇත්තාවූ; අරණවසි, ආරණ්‍යවාස ඇති; දමති, ධර්මන්‍යාය ඇති; නරවනී, නිශ්ශබ්දවූ; නොහොත්; නර අවනී, මනුෂ්‍යයන් පාලනය කරන්නාවූ; සපිරි අඟ,

සම්පූර්ණවූදෙහ ශ්‍රී ඇති; නොහොත්; සපිරි අඟ, සම්පූර්ණකොට පුරනලද බුද්ධාංග ඇති; නලඳු, අනංගයාගේ; රිසි, ඉච්ඡාව; හැර දුරු කළාවූ; මගසනී, මාර්ගාවතාරයකොට ඇති; නොහොත්; මඟී අසනී, නිරොධාමෘතය අනුභව කරන්නාවූ; සගස නුන්නද, යසස්සහිතවූ සතුති ඝොෂා ඇති; රසලප, (අෂ්ට ව්‍යඤ්ජන රසොපෙත) මධුරාලාප ඇති; යදී, යාචනයන්ට; තවනී, විරුද්ධ නොවන්නාවූ; දද, අභිප්‍රායදායකවූ; නසී, ශාක්‍යසිංහවූ; නත, ලොකනාථවූ; සිරිද, ලෞකිකලොකොත්තරසැපදායකවූ; සුනිමන, සුනිමසනාවූ; හෙවත් නොමඩුලුවසා මොනවට අඳනාවූ; නම, වැන්දයුතුවූ; නොහොත්; නම, (සියලු ලෝවැසියන් තමන් වහන්සේකරා) නමන්නාවූ; දම්, (නවලොකොත්තර) ධර්මයන් ඇත්තාවූ නොහොත්; දමි, දමිතවූ; අගමුනි, (ෂට්විධ මුනීන්ට) අග්‍රවූ ඒ බුදුරජාණන් වහන්සේට; වඳුව නමස්කාර කරවු.

12 දනනද නකස වීතප මසදිති කුලු කු ල  
දපන මිහවස නදසන සෙද සවනස ල  
දපම නමද බියපි සර මරදු න සක ල  
දද දද නගණ කස ක'ස සිදපි ලල ල ල

12. දනනද, ජනානන්ද කරවූ; නකස, කාම කම් රහිතවූ නොහොත් නකස, (රාගාදි කෙලෙස්) කසට රහිතවූ; වීතප, අනල්පවූ; අමඅස, අමෘතානුභාව ඇති; කුලුකුල, ලක්‍ෂණවූ කුලයෙහි; හෙවත්; ශාක්‍යරාජ වංශයෙහි; දිති, ජනිතවූ; තමන්දප, තමන් වහන්සේගේ වීර්‍ය්‍ය සංඛ්‍යාත දර්පයාගේ; අවසන දසන, (බුද්ධත්වයට පැමිණීමෙන්) සොළොස්වර දුටුවාවූ; නොහොත්; තමන්දප, තමන් වහන්සේගේ සද්ධර්ම වචන සංඛ්‍යාත ජලපානය; සවන සලසෙද, ශ්‍රවණය කරන්නාවූ ඇසිල්ලෙහි; අවසන දසන, (භව) කොටිය දක්නාවූ; හෙවත් නිර්වාණය දක්නාවූ; දපම්, ප්‍රමාණවූ වචන ඇති; හෙවත්; මිතභාණීවූ; නොහොත්; දපඅම්, වචනාමෘත ඇති; බියපිසර, (සකල සංසාර) භයදුරු කළාවූ; මරදු, (කාණ්ඩාරතී රගා සංඛ්‍යාත) මාරධීතෘන්; නසකල, ත්‍රාසනයකොට හැරියාවූ; දද, (ලොකානුග්‍රහට අසහාය) ධ්වජවූ; දද නගන, (ඒ ඒ බුද්ධ මඟුලෙහි සියලු ලොව පුරා නංවනලද) ධ්වජමාලා ඇති; ක, ජලය; ක, ආකාශය; න, පෘථිවිය යන සියලු තන්හි පැවති; අක, ඇස් ඇති; හෙවත් පෘථිවි සමුද්‍රාකාශාදි සියල්ල දක්නාවූ දිවැස් ඇති; සිදී අපිල, ක්ලේශ සංක්‍ෂය; හෙවත් කැඩීම සිදිනාලද; ල, චිත්තසන්තාන ඇති; ලල, (අනොපමවූ බුද්ධ ශ්‍රීන්) ලීලා පෙනෙන ඒ බුදුරජාණන් වහන්සේට; නමද, (ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධොයනාදී බුද්ධගුණකීර්තිමෙන්) නමස්කාර කරවු.

13 ස කා  වසිනෙක් දගස් සත්සිය දෙසිව් ම න
ල කා  සිරි රජදිරජසිහ නිරිඳුම ස  ව න
නි කා  රජගුරු ගෝලුදම් රම් යතිරු  ව න
ස කා  කොළෙ මෙබර කව්ගැබිනම් අමුතුව න

13. සකවසින්, (ශ්‍රීමත් ශකනරෙන්ද්‍රයාගේ) වර්ෂයෙන්; එක් දහස්, එකසහස්‍රයක් හා; සත්සිය දෙසිව් වන, සත්සිය අටක්වූ; සිරිලක, ශ්‍රී ලඞ්කාද්වීපයෙහි; රජදි රජසිහ, රාජාධිරාජසිංහ නම්වූ; නිරිඳුව, නරේන්ද්‍රයාහට; සවන, ෂට්වැනි වර්ෂයෙහි; හෙවත් සක වර්ෂයෙන් එක්දහස් සත්සිය අටක්වූ රාජාධි රාජසිංහ මහරජතුමා ලඞ්කා රාජ්‍යයට පැමිණි සවෙනි වර්ෂයෙහි; නිකාරජ ගුරු, රාජත්‍රිකාචාර්‍ය්‍යයාගේ; හෙවත් රජතුන්හට්ටුවකට ගුරුවූ; අතතරගම බණ්ඩාර නම් මහා කවීශ්‍රේෂ්ඨෝත්තමයාණන්ගේ; ගෝලු, ශිෂ්‍යවූ; දම්රම් යතිරුවන, ධර්මාරාමාභිධාන යතීන්ද්‍රෝත්තමයාණන් වහන්සේ; අමුතුවන, (කාව්‍ය චූඩාමණි ආදී ශිෂ්ටකාව්‍ය ග්‍රන්ථයන්හි නිර්දිෂ්ට කාව්‍ය නාම ගණිවක්‍රනම් ප්‍රබන්ධයට වෙනස්ව තිබෙන්ට රචනාකළ හෙයින්) අමුත්තක්වූ; බරකව්ගැබි නම් බාරශ කාව්‍ය ගර්භ නම්වූ; හෙවත් සතර අතට තිස්ල එක එක අතකට සිව්පද තුන තුනවශයෙන් සමුද්‍රඝොෂනම් වෘත්තයෙන් වූ සිව්පද දොළසක් සම්පූර්ණව කියවෙන හෙයින් බාරශ කාව්‍ය ගර්භ නම්වූ; මෙසක, මේවෘත්‍තය; කොළේ, ප්‍රබන්ධ කළසේක.

14 මෙනිරිඳු  මෙසක නරඹා යිය සකි නිඳු  රු
නෙවිරිඳු  කිමිඳු කුල ගෙලෙ බන්පාස යු  රු
පිරිසිඳු  මෙනෙත් පල්ලේ බැද්ද ගම්ව  රු
මෙයනිඳු  හට පිදි මිහි පවයිනා තු  රු

14. මෙනිරිඳු, (යථොක්ත රාජාධි රාජසිංහ නම්වූ;) මේ න රේන්ද්‍ර තෙම; නෙවිරිඳු, නොයෙක් විරුදම්වූ; කිමිඳු කුල, කාමින්ද්‍ර සමූහයාගේ; ගෙළෙ, ග්‍රීවයෙහි; හෙවත් ඉබාටුවෙහි; බන්, බඳනා

ලද්දාවූ; පාසපුරු, මාලයක් වැනිවූ; මෙසක, මේ (බාරශ කාව්‍ය ශශීනාම) චක්‍රය; සියසකිති, ස්වකීය අක්ෂින් සාරණකොටගෙන; තෙමත් තමන්ගේ දෑසින්; ඉදුරු, සෘජුව; නොහොත්; ඉදුරා, යහපත්ව; නරඹා, නිරීක්ෂණය කොට; පල්ලේ බැද්ද ගම්වරා, පල්ලේ බැද්දයයි ප්‍රසිඩවූ; (කොලොන්නා කෝරළයෙහි පිහිටි) ග්‍රාමවරයක් හෙවත් පල්ලේ බැද්දයයි නම්ලත් උතුම් ගමක්; මෙය නිදහට, (යථොක්ත) මේ ධර්මාරාමාභිධාන ස්ථවිරොත්තමයාණන් වහන්සේට; මිහිපවනිතාතුරා, පෑවිඩිය පවතිනාතෙක්; (ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානුගතව භුක්ති විඳීමට) පිරිසිදු මෙතෙන්, පරිසුඩ චිත්තයෙන්; (උපලක්ෂිතව) පිදී, පූජකළේය.

## බාරශ කාව්‍යය නිමි.

## [illegible]ශ කාව්‍ය ගර්භ චක්‍රය

නමව මුනි සරණ.

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සි | සි | සි | තු | ද | ය | ල | ති | ති | ති | ති | ති | [illegible] | ප | ල | ල | ල | ල |
| සි | රි | ව | ල | දි | ශු | න | ව | ස | ව | මු | සි | න | ද | කු | ස | සා | ල |
| සි | දි | බ | ව | ධි | ම | ණ | ර | ග | න | ග | මි | ණ | ප | එ | න | ස | ල |
| සි | රි | ග | න | ති | ර | න | න | ම | දි | මි | න් | ව | ණ | නු | ව | න | ල |
| න් | ස | න | ග | | | | ති | ර | ය | ද | | | | ති | ස | දු | වි |
| ද | ර | පු | න | | බර | | ම | ග | ද | ම | | නම | | දි | ද | ර | ද |
| න | ස | න | න | | | | ද | සි | ද | න | | | | ස | සෙ | ම | සි |
| න | ව | ර | ද | න | ව | ස | සි | රි | ප | න | ල | ම | ණි | ම | න | ර | සා |
| න | ර | ම | ණ | න | න | ණ | ව | පු | ල | ව | න | ම | පු | ප | ස | ස | සා |
| න | න | ස | ද | ද | ම | න | න | ල | ස | ති | රි | සි | රු | න | ද | පි | සා |
| න | ව | නු | ස | න | ද | පු | ර | ණ | ර | පු | න | ම | දු | වි | න | ය | සා |
| දු | ඒන | ව | න | | | | න | ව | ද | ද | | | | ස | ස | බි | න |
| මි | ද | දු | ප | | ගබ | | ව | දු | න | රි | | සක | | සා | ව | ද | ග |
| ද | ව | ව | ති | | | | සු | ම | ති | සි | | | | න | න | ම | න |
| ග | න | ය | දි | ස | නො | ස | ද | ග | නු | න | ද | [illegible] | ති | ද | ම | න | ද |
| ග | රු | පි | පු | ව | දු | ව | න | ර | ස | න | න | ව | ග | න | න | ම | ද |
| ග | ණ | න | ද | න | සා | ල | න | පි | ය | සි | හ | ර | ණ | න | ප | ප | ද |
| ග | ග | ග | ග | න | ර | ස | ස | ස | ස | ස | න | ප | ර | ද | ද | ද | ද |

### පැ ස සු ම ක්

ත ද ප ද  ගැඹුරු සව්සත දූනගෙන යෙහෙ  න
ඹ ද සි ද  පදිබු නෙතහරි මුවරද ලෙසී  න
ග ද න ද  කරන මොරතොට යතිඳුගෙ සව  න
වැ ද වැ ද  ඉදිම් සිරිපාපුවල දින දි  න

(රාජාධිරාජසිංහ)

### සක්වල විස්තරයේ අවසාන කව

සත්තිර  දිනු විසිදුගම තෙර පසි  දු
විස්තර  නැණින් දූන ඇහිලෙස කි පසි  දු
විස්තර  කවුනලින් දුටු එළු බිණ පුරැ  දු
විස්තර  කවි කළේ මිහිපා තෙරිඳු ස  දු

### ත ව ත් සො න ස අ ව සා න ක ව ක්

කී ත්  දිගු බිත සුසැදූ නිති හැමස  දැ
මෙත්  මහනෙත් පාමුල මහ යති ස  ද
ස ත්  වග සෙත් කළ සුගතිඳු පද වැ  ද
සි ත්  ලෙස සත්සාලෙ මොක්සැප්මනාත  ද

### ද හ මි සො ඬ ද න මේ මුල

සියල්  සසර දුක් දුරු කරන බෝ  දය
විපුල්  දිමත ගජරල කෙසර නා  දය

### නවනාමාවලියේ දෙවැනි කව

පා ණී  සක තිවට මාදව සඩාන  න
පා ණී  බරණ ගහනත් තිලඹර කිව  න
පා ණී  සුරැ විබාකර ගුරු ඉඳු නද  න
පා ණී  ලෙව් මෙසුර යැම රුකාදෙත් තිනි  න

(තල්ගහගොඩ යතිඳු)

### පා ද වෙජ් ද ස ක්

රුගෙන  මන්ම තිරයේ ලෝදියසෙපි  දු
රුගෙන  මන්ව බී කුළුවර හැකක කො  දු
රුගෙන  පත්වූ සඳ අගනක් කරු රැ  දු
රුගෙන  මදනාට මූදෙය වේය ඉ  දු

(බලවත්තල මගත්මගෙ)

### ෂඩාක්ෂර අකාර බන්ධනයක්

සතතම  පද සතර සර සත ඔත සල  ස
සතතම  බණ සවන අබරණ කර සක  ස
සතතම  සහ සරණ සරණට කරදග  ස
සතතම  සග පවග නරයටමග සලස  ස

(නාහල්ලේ සවාමි

### ශු ශි ඛ සි ව ප් ද ස ක්

සිනාසිසී දූහින් පුටුව දෙන  ලි යේ
මුවාවට ගොසින් ඉකිබිඳ අඬන  ලි යේ
මම්ම නොවෙයි කල්බැන්දේ පුරුදු  ලි යේ
මාදෙස බිල බලා නාඬන්න රන්  ලි යේ

(සූලව ගෙදර සවාමි)

කෑත්  කුල පරක්කම නරනිදුගෙන් මෙපි  ට
සි ත්  සුපසන් රජුන්ගෙන් තෙරුවන් නම  ට
කි ත්  සිරි රාජ සිහ නරනිදු ලෙස ලොව  ට
ප ත්  රජ තුමෙක් නැත මේ සිරි ලක් දිව  ට

(සඟරාජවත)

බ බුලු  මමින් ගෙළලන ලෙසට කරතු  ට
ඔ පලු  සතස රන්දම් දෙව්වේ කුම  ට
ළ කලු  නරේන්ද්‍රසිහ හිමි නොලැබෙන කල  ට
ක දුලු  මෙමුතුහර ඇත පළඳින ලෙස  ට

(ශෘංගාරය)

### ස ඞ්‍යා ව ර්ණ නා ව ක්

හිම කර  හිමි නිසා සත වෙත එන බැවි  න
මන හර  නුබ විමන සුසඳ සිත නොසි  න
ගෙනහැර  ඉසපු අසෙනිය කුසුමන් සිරි  න
එම්වර  තුරුනිකර දිස්විය මුළු ගග  න

(නරේන්ද්‍රසිංහ රජුගේ දෙඩම්වල කිවිඳු)

### ජෙ ග ණ ලෙ ස

අඥේ වායු සහ මලමූ වැලකුම  ද
සාද පිපාසා නිදි කැසි කිවිසුම  ද
වැසන සුවාසස් කාඳුලුත් ඇනුම  ද
මමන සම්බවත් මෙතෙලසය මනනද

(මෝරගම්මන)

### ලංසිමේ පිම්මක් ගසා බෙල්ල කැඩී මැරී සිටින විට
### අ ඥ වේ ණි ක වි ය

සෙල්ල  මට ලංසිමේ ගැසූ පිම්ම  ට
බෙල්ල  කැඩී මැරුණා පිතරයි දූන  ටී
එ ල්ල  වෙලා හෙම අතකට කකුලක්  ට
ලෙල්ල  මක් නොවී ගියඑක ඇත හොඳ  ට

### ව න ව ණී නා ව ක්

ක ම ල් පු ල්  සුපිපි මුවරද ගෙන ලො ල්ල
කොවුල් තු ල්  බඹර රණගස සැදි දු  ල්ල
සි ලි ල් නි ල්  මිණෙවි මුතුපට සුදුවැ  ල්ල
ල ක ල් වි ල්  දැකාම සිත විය සුවිපු  ල්ල

(නරේන්ද්‍රසිංහ රජුගේ මුදලි තැන්පත් වික්‍රමසිංහ පඬිත)

### සතු ති ය ක්

නැරිය වෙ ති න්  වෙණ සරසරස මි  දු න ද
ආ රිය ර දු න්  හට පසිඳුන් පසි  දු ර ද
සූ රිය කුලෙ න්  පත් රජසිංහ නිරි  දු ස ද
වී රිය බෙලෙන්  නොතිබිය ලකා විරි  දු ර ද

(උඩුවේ කුඩා මොහොට්ටාල)

### අ ති ස යෝ කති ය ක්

ග රු වූ  සිතින් කිවියෙකු කැළතම් වා  ද
උ රු වූ  නැණ සියෙන්වූකල සුළුවේ  ද
සු රු වූ  ගෝලවරු සිටිනා කල සා  ද
ගු රු වූ  සඟිඳු යසකිය නුම කවරේ  ද

(මුංකොටුවේ අබේසිංහරාළ)

සි රි  වර රජසිහ නිරිඳුගෙ යසපව  ර
කි රි  සිඳු ලෙසින් දිලුණෙන් සැම ලොවනොහැ  ර
හ රි  ස කහර නිවෙස බඹසකපුත් සිසි  ර
පි රි  සිඳ කෙලෙස දැනගත හැකිවේති මෙව  ර

(බින්තැන්නේ සවාමි)

සිරි ල ක්  එළිය කළ රජසිහ නිරිඳුහ  ට
සරි ස ස්  සුරිඳු මිස වෙන නැත මෙදියත  ට
අණස ක්  පතළ කුරවා තිලොව යසස  ට
තිරදෙක්  ඇද්ද වෙන බඹ උපතින් මෙපි  ට

(කිරිමැටියාවෙ)

## ද ළ දා සෙ ළ හ ර ක්

පා මි න් සමාමග පෙළහර හරින්දූ ට
ලෝතුන් බබුළුවා සන්සැය සමාර ට
පි ළිම න් අතුරුදන් ගත් බුදුබව එපි ට
යා මි න් පෙරයෙ පිය සාරඹුව අබතුර ට
(වැලිගල කිවි)

දි න ප නි දින සඟ සි සි දින රතඟ දි න
සොමිසුන දින ඇ දු ප් දු දින සිතුරු දි න
සූ රූප හි දින හ ට ගි ම් දින මෙහැම දි න
ඔ බ දි න දින ඇතිතෙක් දින රසු සො දි න
(පුවක්දෙණියේ සවාමි)

අ රු ණ ට පළමු හැගිසිට මුව දෙවුන් සො ට
නමසොට තොරැවනට බැතිපෙම වඩා කු ට
අ ද සෙ ට ලැබෙන සක්විති ඉසුරක් ලෙස ට
සි යි ය ට රැගෙන උගතිව සහර පෙමසො ට
(බාලෝවාදය)

ලෙ ව් සත දනින් නම් ගැලවෙන්නට සස ර
දෙ ව් සැප ලබන්නට උපදෙස ඇත ගෙද ර
ම ව් පිය නැදි මයිල් ඇතට හළු අද ර
ලොව් තුරු මුනිඳුන්ට පුදකළ මෙනි ගැඹු ර
(බවෝපකාරය)

## හ සු න ක්

ම න් වන කුළුණු සපු නිලමේ යේම ලැ ම
දූ න් මට එන්ට අසගසු බව හියාළු ම
බ න් බර මැතිසඳට අපලක් වේ රඟ ම
මදන් හට ගොදේ ඔගෙ ඇති මගෙ උදළු හ ම
(යල්හාදලියේ ලේකම්)

බිඳ සිස් අඳුරු හෙළිකළ දිහ ර දෑ ණි න්
ඔද පත් විහිත දනන් සොඳ පිරි ස දෑ ණි න්
අග පත් තිලෝගුරු අප මුනිර දෑ ණි න්
හැරදත් සොතෙන් නැත මෙදුසට වෙ දෑ ණි න්
(විජේවික්‍රම මුගනදිරම්)

නිමි